## WEATHER FORECAST FOR 26th JULY 2018

**(Issued at 05.30 a.m. on 26th July 2018)**

Showers or thundershowers will occur in Uva and Eastern provinces and in Polonnaruwa, Mullaitivu and Vauniya districts after 2.00 pm. Fairly heavy falls about 50 mm can be expected at some places in Uva and Eastern provinces.
Several spells of showers will occur in Central, Sabaragamuwa and Western provinces and light showers will occur in Kurunegala, Galle and Matara districts.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

ඌව සහ නැගෙනහිර පළාත් වලත් පොලොන්නරුව, මුලතිවු සහ වවුනියා දිස්ත්‍රික්කවලත් සවස 2.00 න් පමණ පසු වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. ඌව සහ නැගෙනහිර පළාත්වල ඇතැම් ස්ථානවලට මි.මී. 50ක පමණ තරමක් තද වැසි ඇති විය හැක.
මධ්‍යම, සබරගමුව සහ බස්නාහිර පළාත්වල වැසි වාර කිහිපයක් ඇතිවන අතර කුරුණෑගල, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල සිහින් වැසි ඇතිවේ.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 26th July 2018)

**The sea areas off the coast extending from Puttalam to Batticaloa via Colombo and Galle, may rough and may experience surges (particularly during high tide time) due to the effect of swell waves, having 3.0 -3.5 meter height.**

Showers or thunder showers will occur at a few places in the eastern sea areas and light showers may occur in the sea areas extending from Colombo to Matara via Galle.
Winds will be westerly or south-westerly in direction in the sea areas around the island and wind speed will be 30-40 kmph.

**The sea areas extending from Puttalam to Pottuvil via Negombo, Galle and Hambanthota can be rough at times as the wind speed can increase up to 60 kmph at times.**

**Naval and fishing communities are requested to be vigilant in this regards.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය 2018 ජූලි මස 26 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

**අද දිනයේදී පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ මීටර් 3.0 – 3.5 ක් පමණ (මෙය ගොඩබිමට පැමිණෙන රළ උස නොවේ.) ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා පොතුවිල් දක්වා වන වෙරළබඩ ප්‍රදේශවල මුහුද රළු වන අතර මුහුදු රළ සුළු වශයෙන් ගොඩබිමට පැමිණීමේ හැකියාවක් (විශේෂයෙන් වඩදිය පවතින විටදී) පවතී.**
දිවයිනට නැගෙනහිරින් වන මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර කොළඹ සිට ගාල්ල හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශවල සිහින් වැසි ඇතිවිය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර හෝ නිරිත දිශාවලින් හමන අතර සුළඟේ වේගය පැ.කි.මී. 30-40 ක් පමණ වේ.

**පුත්තලම සිට මීගමුව, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 60 දක්වා වැඩිවීමේ හැකියාව පවතී. මේ නිසා එම මුහුදු ප්‍රදේශ රළු විය හැක.**

**ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/07/26
Time : 0547 am
D (Ops)/DC/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)